# Living the Lotus

1

2021

VOL. 184

Buddhism in Everyday Life




## නිර්මාතෘ සංකල්පනා

රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදි නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදී. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මූලික කරගෙන එහි කටයුතු කරනු ලැබේ. පවුල තුලත්, කාර්යාලයේදීත්, සමාජයේදීත් බුදු දහම ජීවිතයට බද්ධ කර ගෙන, සාමාකාමී ලෝවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි.

වර්තමානයේදී නිචිකෝ නිවානෝ ප්‍රධානීතුමාගේ මූලිකත්වයෙන්, සාමාජික සාමාජිකාවන් සැම ධර්ම ව්‍යප්තියේ යෙදෙමින් අත් වැල් බැදගෙන සෑම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලි සිටියි.


Living the Lotus
Vol. 184 (January 2021)

Senior Editor: Keiichi Akagawa
Editor: Kensuke Osada
Copy Editor: P.A.D. Somapala,
Ruklanthi Palipana, Sahan Chamara

Living the Lotus is published monthly by
Rissho Kosei-kai International,
Fumon Media Center 3F, 2-7-1 Wada,
Suginami-ku, Tokyo 166-8537, Japan.
TEL: +81-3-5341-1124
FAX: +81-3-5341-1224
Email:
living.the.lotus.rk-international@kosei-kai.or.jp


## දැස ඉදිරිපිට සිටින බුදුන්ට පුද පූජා කරමු

සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය තුලදි, සියළුම සත්වයන් බුදු බවට පත්වන විවරණ බුදුන් වහන්සේ විසින් ලබා දෙනවා. නමුත් එහිදී නොයෙකුත් කොන්දේසිද පැනවුවා. උදාහරණයක් ලෙස, ශාරිපුත්‍ර තෙරුණ් වහන්සේට ලබා දෙන විවරණයෙහිදී 'ශාරිපුත්‍රයනි, ඔබ අසංඛ්‍ය වූ බුදුවරුන්ට නොයෙකුත් පුද පූජා පවත්වා, බෝධිසත්ව චර්යයාවන් ප්‍රගුණ කරනවිට, මතු අනාගතයේදී පද්ම ප්‍රභා තථාගත නමින් බුදු බවට පත්වී, විශාල පිරිසක් දුකින් මුදවා ගන්නාහ' ලෙස දේශනා කලා. එහිදී, බුදු බවට පත්වීමේ කොන්දේසියක් ලෙස අසංඛ්‍ය වූ බුදුවරුන්ට පුද පූජා පැවැත්වීම දක්වා තිබෙන බැවින්, එය කිසිවිටෙක ලඟා විය නොහැකි දෙයක් ලෙසිනුයි අපි සිතන්නේ.

නමුත් එය කළ යුතු ආකාරයද වඩා ප්‍රයෝගිකව සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ, අගර්හිත බෝධිසත්වයන් වහන්සේගේ පරිච්ඡේදයේදි පෙන්වා දී තිබේ. අගර්හිත බෝධිසත්වයන් වහන්සේ හමුවන සෑම පුද්ගලයෙකුටම ගෞරව වන්දනා කරනවා. තමන්ට නින්ද පරිබව කරන පුද්ගලයන් හා පහර දෙන පුද්ගලයන්ගේ බුදුන්ව දැකීමටද නිතරම කටයුතු කරනවා.

අපිටත් පවුල තුල, රැකියා ආයතනය හා සමාජය තුල අසීමිත පුද්ගලයන් පිරිසක් හමුවෙනවා. ඒ සෑම පුද්ගලයෙකු තුලම බුදු කෙනෙකුද වැඩ සිටිනවා. ඒ සියළු බුදුන් වහන්සේලාට ගෞරව කිරීම, අසංඛ්‍ය බුදුවරුන්ට පුද පූජා පැවැත්වීම ලෙස පැවසිය හැකිය. එබැවින් නිතරම තමාව ආරක්ෂා කර ගැනීමට පමනක් උත්සහ නොකර, හමුවන සෑම පුද්ගලයෙකුටම සතුට උදකර දිය හැකි කෙනකු බවට පත්වීමට අධිෂ්ඨානයක් ඇති කර ගත යුතු නොවේද. ඒ වෙනුවෙන් මුලින්ම තමා දිප්තියෙන් බැබලෙන පුද්ගලයෙකු බවට පත්විය යුතුයි. එසේ අධිෂ්ඨාන කරගන්නේ නම්, මේ වසර ඉතාමත් විශිෂ්ට වසරක් බවට පත්වේ.

නිර්මාතෘ සංකල්පනා ග්‍රන්ථය ඇසුරිනි. 10, P. 108-109


Living the Lotus-Buddhism in Everyday Life (සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය තුල ජීවත්වෙමු - එදිනෙද දිවියට බුදු දහම බද්ධ කර ගනිමු.) යන තේමාව තුල, එදිනෙද ජීවිතයට සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ කියාදීම් බද්ධ කර ගෙන මඩෙහි පිපෙන්නාවූ ලස්සන නෙලුම් මලක් සේ තම ජීවිතය සමෘධිමත් කරගෙන, එලෙසම වැඩි වටිනාකමින් යුතු තත්වයට පත් විය යුතුය යන ප්‍රාර්ථනය ගැබ් වී ඇත. මෙම සඟරාව මගින් ලෝකය පුරා ව්‍යාප්ත වී සිටින්නාවූ සාමාජික සාමාජිකාවන් එදිනෙද දිවියට බුදුදහම බද්ධ කරගෙන කටයුතු කරන්නාවූ අයුරු අන්තර්ජාල මාර්ගයෙන් බෙදහැරීම සිදු කරනු ලැබේ.



## *President's Message*

# අගර්හිත බෝධිසත්වයන් වහන්සේ වාගේ

**නිවිකෝ නිවානෝ තුමා**
**ප්‍රධානී, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය**

### ගෞරව වන්දනා කිරීමේ සිතුවිල්ලෙන් මූර්තිමත් වෙමු

සුබ නව වසරක් වේවා.

මේ වසරේදීත් 'යහපත් වැඩ' නොකඩවා සිදුකරමින්, ඉතා සුන්දර හා සමෘද්ධිමත් වසරක් බවට පත්කර ගනිමු. ඒ වෙනුවෙන් මෙහි සඳහන් කල 'යහපත් වැඩ' මොනවාදැයි කල්පනා කර බලමු.

මේ වසරේදී '800 වන ජන්ම සංවත්සරය'සමරන නිචිරෙන් ෂෝනින් තුමා මෙසේ සඳහන් කර ඇත, 'බුදු දහම තුල සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය ඉතා වැදගත් සූත්‍රයකි. ඒ තුල ප්‍රයෝගික පුහුණුව ගැන සඳහන් වන්නේ අගර්හිත බෝධිසත්වයන් වහන්සේ පිලිබඳ දැක්වෙන පරිච්ඡේදයෙනි. එම අගර්හිත බෝධිසත්වයන් වහන්සේ සෑම මනුෂ්‍යයෙකුටම ගෞරව කලේ කුමන හේතුවක් මතද යන්න හොඳින් කල්පනා කරන්න.'

ඒ අනුව 'අගර්හිත බෝධිසත්වයන් වහන්සේගේ පරිච්ඡේදයේදී' ධර්මය ඉගෙන ගන්නා අපිට, එදිනෙදා ජීවිතයට අවශ්‍ය වන මූලික පදනම වන 'යහපත් කරුණු' පිලිබඳ ගෙනහැර දක්වන බවට පිලිගත යුතුය.

ඔබ සියළුදෙනාම දන්නා පරිදි අගර්හිත බෝධිසත්වයන් වහන්සේ, හමුවන ඕනෑම පුද්ගලයෙකුට ගෞරව, වන්දනා කර 'ඔබ සියළුදෙනාට ගෞරව කරමි. කිසිවිටෙක අපහාස නොකරමි. ඒ ඔබ සියළුදෙනාම, බෝධිසත්ව මාර්ගයේ ගමන් කර අනිවාර්යයෙන්ම බුදු බවට පත්වන නිසාය' ලෙස වර්ණනා කලහ. ඒ අනුව කොපමණ දරුණු වද හිංසා වලට ලක්වුවත්, මිනිසුන්ව පහත්කොට නොසලකා, කේන්ති නොගෙන හා වෛර නොකර, ඉවසා වදරමින් මිනිසුන්ගේ නින්දා වලින් හා ප්‍ර චණ්ඩත්වයෙන් ඈතට ගොස් ගෞරව නමස්කාර කිරීම නොකඩවා සිදු කලහ.

අගර්හිත බෝධිසත්වයන් වහන්සේගේ පරිච්ඡේදයේදී, බුද්ධ ශක්තිය අවධි කර ගැනීම හා බෝධිසත්ව චර්යයාව මූලික කර ගෙන දේශනා අතරම, නිතරම දෑත් එක් කර වන්දනා කිරීමේ ස්වරූපය බෞද්ධයන්ගේ ආදර්ශ පාඨය සේ පවසයි. නමුත් අගර්හිත බෝධිසත්වයන් වහන්සේ දෙස හොඳින් බැලුවිට, දෑත් එක් කර ගෞරව වන්දනා කල යුත්තේ මෙවැනි පුද්ගලයන්ටයි සේ නිර්ණායක වල සිරවී නොසිට, 'මිනිසුන්ට වන්දනා කරමින් සිටියේ ය' සේ සූත්‍ර පොතෙහි සඳහන් වේ. ඒ ආකාරයට හමුවන සෑම පුද්ගලයෙකුටම ගෞරව වන්දනා කලහ. එම ආධ්‍යාත්මය හොඳින් රස විඳ, මුළු ශරීරයෙන්ම ඒ අනුව කටයුතු කරන්නෙ නම්, එය ස්වභාවිකවම 'යහපත් ක්‍රියාවක්' බවට පත් වෙයි.

## අගර්හිත බෝධිසත්වයන් වහන්සේ හා වැස්සට පරාජය නොවී

අපිට ඉර ආලෝකය, ජලය හා වාතය නොමැතිව නිසැකවම ජීවත් විය නොහැකිය. එවැනි දේ වලට කෘතවේදි විම අප සිදු කල යුතු වැදගත් ධර්ම පුහුණුවකි. එසේ කාලගුණයට දෝෂාරෝපණය නොකිරීම, ජලය වැදගත්ව භාවිතා කිරිම හා සෑම දෙයක්ම නාස්ති නොකිරීමද ගෞරව වන්දනාවේ එක් අංගයකි. එසේම, අන්‍යයන්ට අඩුපාඩු වැරදි හා අවලාද නොකීම හා කේලාම් කීම, තරහා නොගැනීමද ගෞරව වන්දනා කිරීමේ ප්‍රායෝගික පුහුණුවයි. එසේ අන්‍යයන්ගේ බුද්ධ ශක්තිය විශ්වාස කිරීම, මනුෂ්‍යයන් ලෙස අප කල යුතු රාජකාරියද වේ.

එනම් අප කරන ක්‍රියාවන්, ආකල්ප හා වදන් භාවිතය යන සෑම දෙයක්ම ගෞරව වන්දනා කිරීමේ ස්වරූපය දිස්වන දේවල් වේ. ඒ සෑම දෙයකින්ම තමාගේ බුද්ධ ශක්තිය අවබෝධ කරගෙන, අන්‍යයන්ගේ බුද්ධ ශක්තියද අවබෝධ කරලනවා වේ.

ජපානයේ ළමා කතා රචිකයෙකු සේ සුප්‍රසිද්ධ කෙන්ජි මියසාවා මහතාගේ 'වැස්සට පරාජය නොවී' කවි පන්තියෙන් උපුටාගත් කවියක් පහත සදහන් වේ.

'අන්‍යයන්ට අනුකූල වන, පැසසුම් නොලබන, වදයක් නොවෙන, පුද්ගලයෙකු වීමට සිතේය මට'. අගර්හිත බෝධිසත්වයන් වහන්සේගේ චරිත දමයෙන් ආභාෂය ලැබූ කෙන්ජි මහතාගේ ප්‍රාර්ථනයන් හා ජීවන ගමන ගැන එයින් සදහන් වේ. මෙම කවි පන්තිය 'අගර්හිත බෝධිසත්වයන් වහන්සේගේ' පරිච්ඡේදය සමඟ එකට බද්ධ කරන ආකාරයෙන් කියවා බැලුවිට, වෙන කවරදටත් වඩා පැහැදීමක් ඇතිවිය. මන්දයත්, සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය සමඟ ජීවත් වූ මියසාවා මහතාගේ වදන් වලින් 'අගර්හිත බෝධිසත්වයන් වහන්සේගේ පරිච්ඡේදය' ඉතා සරළව මෙම කවි පන්තියට කැටිකොට ඇත. එයින් සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය වන්දනා නොකරන පුද්ගලයන්ට පවා, අගර්හිත බෝධිසත්වයන් වහන්සේගේ ජීවන ගමන හා බෝධිසත්වයෙකු ලෙස කල යුතු ක්‍රියාවන් හා ආකල්ප හොදින්ම පැහැදිලි වන බව දැනුනි.

එම කවි පන්තියේ මෙසේද සදහන් වේ, 'ආශාවන්ගෙන් තොරව, කිසිවිටෙක ක්‍රෝධ නොවන', මේ ගැන නම් පැහැදිලි කිරීමක් අවශ්‍ය නොමැත. එසේම, 'සෑම සියළු දෙයටම තම හැගීම් බද්ධ නොකරමු' යන්නෙන් අන්‍යයන් ප්‍රථමයෙන් යන ස්වරූපය පෙන්වන අතර, 'දැඩි නියං කාලයේ කඳුළු සලමු' යන පේලියෙන් අදහස් කරන්නේ, මිනිසුන්ගේ ශක්තියෙන් කිසිම දෙයක් කිරීමට නොහැකි දුෂ්කරතාවන්ට මුහුණු දෙන පුද්ගලයන්ට සමීප වී, මෛත්‍රිය හා කරුණාව ප්‍රාර්ථනා කිරීම වේ.

ඔබ සියළුදෙනාත් අවස්ථාවක් ලැබුණ විට, මෙම කවි පන්තිය නිදහසේ රස විඳ බලන්න.

From *Kosei*, January 2021

# Spiritual Journey

## සිදුවන සෑම දෙයක්ම ජීවිතයේ වර්ධනයට ඉවහල් වේ

බුද්ධගයා ධර්ම ශාඛාව
අමිත් කුමාර් රොයි

මෙම සෙප්පෝව, 2020 වර්ශයේ අගෝස්තු වන මස 8 වන දින ඕමේ රෙන්සෙයි ඩෝජෝවේ පැවැත්වූ සෙන්යූකයි උත්සවයේදී ඉදිරිපත් කරන ලද්දකි.

සියළුදෙනාගෙන්ම අවසරයි.

මම රොයි අමිත් කුමාර්. මම අද දින අගෝස්තු වන මස කෝසෙයි සඟරාවේ නිචිකෝ නිවානෝ තුමාගේ වන 'අනවශ්‍ය කිසිම දෙයක් නොමැත' යන ධර්ම පණිවුඩය තුළින් ඉගෙන ගත් දේ ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වනවා.

'අනවශ්‍ය කිසිම දෙයක් නොමැත' යන මාතෘකාව මුලින්ම දුටු විට, මම පුදුමයට පත් වුනා. මම මේ ලෝකයේ අනවශ්‍ය දේ බහුල වශයෙන් ඇති බව සිතා සිටි නිසා, නිචිකෝ නිවානෝ තුමා කියාදෙන දේ හරි හැටි වැටහුනේ නැහැ.

ධර්ම පණිවුඩය කියවීමට පටන්ගත් විට එහි, 'අපි දැනටමත් සත්‍යාවබෝධය ලබා සිටිනවා' යැයි ලියා තිබූ නිසා මම තව තවත් පුදුමයට පත් වුනා. අපි සත්‍යාවබෝධ කර සිටිනවා නම් ධර්මය ඉගෙනීමේ අවශ්‍යතාවක් නැහැ යැයි සිතුවා.

ධර්ම පණිවුඩය තුල මේ ආකාරයටත් ලියා තිබුනා. 'අපි දැනටමත් සත්‍යාවබෝධය ලබා සිටින නිසා, තමන්ව විශ්වාස කරමින්, ඒ වාගේම අන් අයව විශ්වාස කරමින් එකිනෙකා සහයෝගයෙන් අධ්‍යාත්මික දියුණුව ඇතිකර ගැනීම තුළින් මේ මුළු ලෝකයම 'පාරාදීසයක්' බවට පත් කරගත හැකි බව කියවේ. ඒ ආකාරයට බුදුන් වහන්සේගේ ධර්මය ඉගෙන ගෙන ජීවිතයේ වටිනාකම අවබෝධ කරගත් විට, අකුරින් ලියා තිබෙන ආකාරයටම ස්තුතිවන්තව ජීවත් වීමට හැකි නමුත්, අවාසනාවන්ත ලෙස අපි සතුටින් ජීවත් වීමට හැකි තමාව අමතක කර දුක්බර ලෙස ජීවිතය ගත කරමින් සිටිනවා.'

මම එම ජේදය කියවා, ගිය වසරේ විදේශීය සිසුවෙක් ලෙස ගකුරින් අධ්‍යාපනය ලැබීමට ඇතුල් වූ මුල් කාලය ගැන පසු විපරම් කර බැලුවා. ඒ කාලයේ මම ගකුරින් පාසල් ජීවිතයේ නොදන්නා දේ බහුල නිසා කනස්සල්ලෙන් පසුවුනා. මාගේ කාමරයේ සිටින මාගේ ජේෂ්ඨයාද මාගේ හැඟීම තේරුම් නොගෙන, ගකුරින් නේවාසිකාගාරයේ නීති රීති නිසා බැණුම් අහන අවස්ථා වැඩි වී, මාගේ ජේෂ්ඨයා සමග එකට සිටීම සිතට වදයක් වී නිතරම ඔහුගෙන් ඈත්ව සිටියා. කාලය ගතවන විට ඔහුට තිබෙන අකමැත්ත වැඩි වී, වසරකට පසු නේවාසිකාගාරයේ කාමර මරු කිරීම නිසා ජේෂ්ඨයා සමග වෙන්වී වෙනත් කාමරයකට යාම සිතට සහනයක් වුනා.

නමුත් ඉන් දින කිහිපයකට පසු, නව විදේශීය සිසුන් ගකුරින් පාසලට ඇතුලත් වී මටත් කණිෂ්ඨයෙක් ලැබුන විට, මට මාගේ ජේෂ්ඨයාගේ හැඟීම ටිකක් තේරුම් ගැනීමට හැකි වුනා.

මා සමඟ එකම කාමරයේ සිටින මාගේ කණිෂ්ඨයාට ගකුරින් නේවාසිකාගරයේ තිබෙන නීති රීති කියාදෙන ගමන්, වසරකට පෙර මම ගැන සිතා බැලුවා. ගකුරින් පාසලට ඇතුලත් වූ මුල් කාලයේ මම දැන් මා ඉදිරියේ සිටින මාගේ කණිෂ්ඨයා වාගේම, ජපන් භාෂාව හරි හැටි නොදැන, ජපන් සංස්කෘතිය දැන සිටියේ නැහැ. එම නිසා ජේෂ්ඨයාගේ බැණුම අහන අවස්ථා වැඩිවී ගකුරින් පාසල් ජීවිතය දුකක් වුනා. නමුත් මම කිහිප වතාවක්ම මාගේ ජේෂ්ඨයාගෙන් බැණුම් ඇසුවේ, ඔහු මා ගැන සිතමින් මාව ඉක්මනින්ම ජපන් ජීවිතයට හැඩ ගැසීමට මට උපකාර කරන්න, ඔහු දන්නාදේ මට කියාදීමට බව පළමු වතාවට මට අවබෝධකරගන්න හැකිවුනා. වසරකට පෙර මම, ජේෂ්ඨයා පිළිබඳ අකමැත්තෙන් මාගේ වර්ධනය ගැන සිතමින් ඔහු කියාදුන් දේ තේරුම් නොගෙන කටයුතු කලා. මා ඔහු ගැන සිතා සිටි වැරදි ආකාරය තේරුම් ගෙන ඔහුට හදවතින්ම



ගකුරින් හී සහෝදර ශිෂ්‍යයන් සමඟ
(දකුණු පැත්තෙ සිට දෙවෙනියට)

ස්තූතිවන්ත වුනා. ඉන් පසු එකිනෙකා හොඳින් කතාබහ කිරීමට පටන් ගෙන, දැන් හොඳ සබඳතාවක් තිබෙනවා.

නිච්කෝ නිවානෝ තුමා, ධර්ම පණිවුඩය තුල 'මේ ලෝකයේ සිදුවන සෑම සිදුවීමක්ම තමාගේ ජීවිතය සතුටින් ගත කිරීමට ලැබෙන ඉඟියක්' බව කියා දෙයි. මාගේ ජ්‍යේෂ්ඨයා සමග කටයුතු කල ආකාරය පසු විපරම් කර බලන විට දුක් සහගත දේත්, සෑම දෙයක්ම තමාගේ වර්ධනය සදහා අත්‍යවශ්‍ය දේ බවත් 'අනවශ්‍ය කිසිම දෙයක් නොමැත' යන්නත් වටහා ගත්තා. ඒ වාගේම ගකුරින් පාසලෙන් ඉගෙනගන්නා දේ වල වටිනාකම වටහා ගත්තා.

මිනිසුන්ට තනිව ජීවත් වීමට නොහැක. අන් අය සමග බැඳියාවෙන් ජීවත් වේ. ඒ වාගෙම, අපේ ප්‍රධානම සතුට, අන් අයට ප්‍රයෝජනවත් පුද්ගලයෙකු බවට පත් වීමයි. මට උදව් උපකාර කල  මාගේ ජ්‍යේෂ්ඨයා වාගේ, මමත් මින් ඉදිරියට අන් අයගේ තත්වයට පත්ව සිතමින් හදවතට සමීපවී, බුදුන් වහන්සේගේ ධර්මය අන් අයට කියාදෙන පුද්ගලයෙකු බවට පත්වීමට කැපවීමෙන් කටයුතු කරනවා.

වර්තමානයේ නව කොරෝනා වෛරසය ලෝකය පුරා පැතිරෙමින් පවතිනවා. කොරෝනා වෛරස ව්‍යාප්තිය නිසා, නිවසින් පිටතට යාම අඩුවී නිවසේ සිටින කාලය වැඩි වී, පෙරටත් වඩා පවුලේ අය සමඟ එකට එක්ව කාලය ගත කිරීමට හැකිවීම හොඳ දෙයක් යැයි සිතනවා. නමුත් මම පවුලේ අයගෙන් ඈත්වී ජපානයේ ජීවත් වන නිසා, ආසාධනය පැතිරෙමින් තිබෙන මාගේ රට වන ඉන්දියාව ගැන හා පවුලේ අය ගැන හිත කනස්සල්ලෙන් සිටිනවා. එම නිසා සූත්‍ර සජ්ජායනා කරන අතරතුරද, එදිනෙද ජීවිතය තුලද, පවුලේ අයගේ ආරක්ෂාව, ඉන්දියාවේ ආසාධනය පැතිරීම අඩු වේවායි ප්‍රාර්ථනා කරනවා.

වර්තමානයේ ඉන්දියාවේ දේශපාලනය ව්‍යාකූල වී, ජනතාවගේ ජීවිත්ත ව්‍යාකූල වී තිබෙනවා. ජපානයේ සිටින නිසා ඉන්දියවේ වර්තමාන තත්වයට මුකුත් නොකර සිටීම, මට මහ කලකිරීමක් දැනෙනවා. මෙවර ධර්ම පණිවුඩය ගෙනහැර දැක්වීමේ අවස්ථාව නිසා, අනාගතයේදී මාගේ මව් රටට ගිය විට, සද්ධර්මපුණ්ඩරීක සූත්‍ර ය, නික්යෝ නිවානෝ තුමාගේ ඉගැන්වීම් හොඳින් අන් අයට කියාදීමට හැකි ලෙස, දැන් මම ජපානයේදී හොඳින් ඉගෙන ගැනීම අන් කිසිදේටත් වඩා වැදගත් බව අවබෝධ කරගත්තා.

ඉන්දියාව අනාගතයේ හොද මාවතකට ගමන් කෙරේවා යැයි ප්‍රාර්ථනා කරමින්, මා රැස් කරගත් පිං අන් සියලු දෙනාටමත් අනුමෝදන් කිරීමට හැකි පරිදි, මිනිසුන් ගැන සිතන කෙනෙකු බවට පත් වන බවට මම දිව්රා පොරොන්දු වනවා.

අද පැමිණි සියළු දෙනාටම බොහොම ස්තූතියි.



*2017 වසරේදී තායිලන්ත ශාඛාවේ පැවති තරුණ සාමාජිකයන්ගේ සම්මන්ත්‍රණයට, ඉන්දියාව නියෝජනය කරමින් අමිත් මහතාද සහභාගී වුනා.*

# සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ
## සාරාංශය හා වැදගත් කරුණු

කර්තෘ නික්යෝ නිවානෝ

## සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය
## 21 වන පරිච්ඡේදය, තථාගතයන් වහන්සේගේ ඍද්ධි බලය

මෙම පරිජ්ඡේදයේදි ශාක්‍යමුණි බුදුන් වහන්සේ ප්‍රමුඛ විශාල විශාල බුදුවරු පිරිසක් මහා ප්‍රාතිහාර්යයක් ප්‍රදර්ශනය කර, 'මේ දක්වා නොයෙකුත් ආකාරයට ධර්ම දේශනා කලත්, සත්‍ය එකකි' යනුවෙන් 'ඒක බුද්ධ යානය' ගැන දැනගැනීමෙන් විශාල ශ්‍රාවක පිරිසක් විශ්මයට පත්වන පරිජ්ඡේදයයි.

### දස ඍද්ධි ප්‍රාතිහාර්යයන්

මෙම ප්‍රාතිහාර්යයන් දස වර්ගයක් ඇත.

පලමුවැන්න, 'දිව බඹ ලොව දක්වා විහිද වීම' වේ. බුදුන් වහන්සේ දේශනා කල වදල සියළුම දේ සත්‍යය වනවා සේම, එහි අරමුණ එකක් බවයි මෙයින් විදහා දක්වන්නේ. එනම්, සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ මුල් කොටස වන බුද්ධ දේශනා හා අග කොටස වන ධර්මයේ හරයද එකකි. පාරවල් දෙකක් වුවත් එකම විශ්වාසයක් ලෙසින් අපගේ ශ්‍රද්ධාවේ කේන්ද්‍රස්ථානය එකක් බව මෙහි අරුථ වේ.

දෙවැන්න, 'ශරීරයෙන් රශ්මි කඳදම්බයක් විහිද වීම' වේ. බුදුන් වහන්සේ දේශනා කළ ධර්මය, මේ විශ්වයේ පවතින සෑම ජීවියෙකුටම අලෝකයක් වේ. මංවුලාවීම් වලින් තොරව ගමන් කිරිමට හැකිවේ. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ මුල් කොටස වන බුද්ධ දේශනා හා අග කොටස වන ධර්මයේ හරයේ න්‍යායන් එකක් බව මෙහි අරුථ වේ.

තුන්වැන්න, කැකෑරීම් ශබ්දයක් විහිද වීම වේ. සියළුම බුදුවරුන්ගේ දේශනා එකම පදනමක් වේ. තුන් යානය යනු ඒක යානය බව මෙහි අරුථ වේ.

හතරවැන්න, ඇඟිලි වලින් ශබ්දයක් විහිද වීම වේ. 'සියළුදෙනාම එක්ව මෙම ධර්මය ප්‍රචාරය කරමු' යනුවෙන් බුදුන් වහන්සේ සමඟ වන පොරොන්දුව මෙයින් පෙන්වයි. තමා හා අන්‍යයන් එකට බද්ධ වී සිටින බව මෙහි අරුථ වේ.

පස්වැන්න, ලෝක ධාතූන් සය ආකාරයකට කම්පනයන් විහිද වීම වේ. අහසත් පොළොවත් සතුටට පත්වීමෙන් ඇතිවන කම්පනය වේ. බෝධිසත්වයන්ගේ ප්‍රයෝගික පුහුණුව එහි අරුථ වේ.

හයවැන්න. 'මහා සත්ව බෝධිසත්වයන් හා සිවුවණක් පිරිස භාග්‍යවතුන් වහන්සේ පිරිවරා සිටීම' වේ. සියළුම බුදුවරුන් හා බෝධිසත්වයන් වහන්සේලා විසින් සෑම සියළු සත්වයෙකුම ආරක්ෂා කරයි. එනම්, වර්තමානයේ නොයෙකුත් ධර්මය අවබෝධ කර ගැනීමේ තත්වයන් වල සිටියද, අනාගතයේදි අංග සම්පූර්ණ වී, ධර්මාවබෝධ ලබා ගත හැකි තත්වයට පත්වන බව මෙහි අරුථ වේ.

සත්වැන්න, 'විවෘත අවකාශය තුල දෙවිවරු විශාල ශබ්දයක් විහිද වීම' වේ. සෑම සියළුදෙනාවම දුකින් මුදවා, ජීවත්කරවිමේ හැකියාව සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයට තිබෙන බව මෙයින් පෙන්වාදෙයි. එසේම අනාගතයේදී සියළුම ආගම් එකම අරමුණක් වෙනුවෙන්

සංවිධාන ගතවන බව මෙහි අරුථ වේ. එය ආගමික සහජීවනයේ පරමාදර්ශී ස්වරූපය ලෙස පැවසිය හැකිය.

අටවැන්න, 'ශාක්‍යමුණි බුදුන් වහන්සේට නමස්කාර කිරීම' වේ. ජීවය තිබෙන සෑම සියළුදෙයම 'ශාක්‍යමුණි බුදුන් වහන්සේට නමස්කාර වේවා' ලෙස පැවසීම වේ. අනාගතයේදී සෑම සියළුදෙනාම සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ කියාදීම් විශ්වාස කරමින්, විශිෂ්ට වු ගතිගුණ වලින් යුතුවීම මෙහි අරුථ වේ.

නවවැන්න, 'විවිධ වටිනා වස්තූන් දස දිශාවේ වලාකුළු වලට එකතු වී වැස්ස වීම' වේ. බුදුන් වහන්සේ සරණ යාම හා කෘතවේදී වීමේ හදවත මෙයින් මෙයින් පෙන්වාදෙයි. අනාගතයේදී සියළුම සත්වයින්, බුදුන් වහන්සේ බලාපොරොත්තු වන ආකාරයට කටයුතු කරන තත්වයට පත්වීම මෙහි අරුථ වේ.

දසවැන්න, 'ලෝක ධාතූන් එකිනෙකට සම්බන්ධ වී එකම බුද්ධ ක්ෂෙත්‍රයක් බවට පත්වීම' වේ. සියළුම ලෝකයන් එකම බුද්ධ ක්ෂෙත්‍රයක් බවට පත්වේ. එනම්, මුළු ලෝකයම එකම ධර්මයක් අනුගමනය කරමින් සමානාත්මතාවයෙන් පිරුණු ලොවක් බවට පත්වීම මෙහි අරමුණ වේ.

මේ සියළුදෙයම සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ විශේෂ ලක්ෂණයන් නොයෙකුත් කෝණවලින් පෙන්වා ඇති අතරම, ලෝකයේ පැවතිය යුතු පරමාදර්ශී ස්වරූපයද වේ.







## සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ මුහුණුවර

දස ප්‍රාතිහාර්යයන් ප්‍රදර්ශනය කල බුදුන් වහන්සේ, මෙලෙසද සදහන් කලා.
'සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ වැදගත් කරුණු සරළව පවසනවා නම්, තථාගතයන් වහන්සේ ගේ සියලුම ධර්මයන්, තථාගතයන් වහන්සේ ගේ අබාධිත සියලූම ඍද්ධි ප්‍ර ාතිහාර්ය බලයන්, තථාගතයන් වහන්සේ ගේ සියලූම අප්‍ර කාශිත ධර්ම භාණ්ඩාගාරයන්, තථාගතයන් වහනසේ ගේ සියලූම ව්‍යුත්පන්න කාරණාවන් මෙම සූත්‍ර ධර්මය තුළ අන්තර්ගත ය. විවරණය කර ඇත. දේශනා කර ඇත.'

මෙය සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ මුහුණුවර ලෙස හදුන්වන අතර, සද්ධර්ම පුණ්ඩරීක සූත්‍ර අන්තර්ගතයේ ආනිශංසස වල එකතුවකි. එනම්, සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය සතු අසීමිත වටිනාකම හා ධර්මයේ නිරවද්‍ය බව බුදුන් වහන්සේගේ වදන් වලින් තව තවත් සාක්ෂාත් කරයි.

## පවරාදීම හා සිටිනා සෑම තැනම ධර්මය පුහුණුවන ස්ථානය වේ

මෙහිදී හදවතට හොඳින් බද්ධ කරගත යුතු වැදගත් කරුණක් තිබේ. එනම්, ශාක්‍යමුණි බුදුන් වහන්සේ විසින් දස ඍද්ධි බලයන් ගැන දේශනා කරමින්, සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ මුහුණුවර හා එහි ආනිශංසස ගැන පැහැදිලි කලේ විශිෂ්ට ප්‍රතිපද ඇති, සීමාතික්‍රාන්ති ප්‍රතිපද ඇති, පිරිසිදු ප්‍රතිපද ඇති, ඍජු ප්‍රතිපද ඇති සිවු මහා බෝධිසත්වයන්ට හා පොළෝ ගර්භයෙන් මතු වී පැමිණි  බෝධිසත්වයන් වහන්සේලාට, සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය ප්‍රචලිත කිරීමේ වගකීම භාර දුනි. මේ ගැන 22 වන පවරා දීම යන පරිච්ඡේදයේදී සදහන් වන අතර එය ඉතාමත් වැදගත් වේ.

එසේම, බෝධිසත්වයන් ලෙස පුහුණු කල යුතු ධර්ම කරුණු පහක් ගැන සදහන් කලහ. බුදුන් වහන්සේගේ එම පවරා දීමට පිලිතුරු දෙමින්, බෝධිසත්වයන් වහන්සේලා තමන් සිටින සෑම තැනම ධර්මය පුහුණුවන ස්ථානය බවට පත්කර ගත යුතු බවද දේශනා කලහ.

එනම්, ඉතාමත් වටිනා වන්නේ සද්ධර්ම පුණ්ඩරීම සූත්‍රයේ කියා දීම් වගේම, ඒ අනුව පුහුණුවීමයි. මෙම කරුණු කාරණා පොළෝ ගර්භයෙන් මතුවී පැමිණි බෝධිසත්වයන් වන අපගේ ආගමික ජිවිතයේ පදනම් බවට පත්වන නිසා, අකමැති වුනත් හොදින් හදවතට බද්ධ කර තබා ගත යුතුය.

නික්යෝ නිවානෝ තුමා විසින් රචිත『සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ සාරාංශය හා වැදගත් කරුණු』
ග්‍රන්ථය ඇසුරෙනි

කෝසෙයි මුද්‍රණ ආයතනයේ ප්‍රකාශනයකි. 2016, P192-P197



# Director's Column

## නව වසරේ අධිෂ්ඨානය

අන්තර්ජාතික මුලස්ථාන ප්‍රධානී
කෙයිචි අකගාවා මහතා

සුබ නව වසරක් වේවා.

මම, කෙයිචි අකගාවා. සයිතෝ මුලස්ථාන ප්‍රධානී තුමාගෙන් පසුව, ගිය වසරේ දෙසැම්බර් මස සිට එම තනතුරට පත්වුනෙමි. අන්තර්ජාතික මුලස්ථානයේ වගකීම් වල උසස් බව හා ප්‍රමාණයේ විශාලත්වය ගැන ව්‍යාකූලත්වයෙන්, දේශීය හා විදේශීය කාර්ය මණ්ඩලයේ අත්දැකීම්, ප්‍රඥාව හා උද්යෝගයේ පිහිටෙන්, මගේ රාජකාරි ආරම්භ කිරීමට හැකිවුනා. වර්තමානයේ කොරෝනා ව්‍යසනය දිගින් දිගටම ව්‍යාප්ත වනවා වුවත්, දවසක් හෝ ඉක්මණින් මෙම ව්‍යසනය අවසන් වේවා කියා, ඔබ සැම දෙනා සමගින් හදවතින්ම ප්‍රාර්ථනා කරනවා.

නිචිකෝ නිවානෝ තුමාගේ ජනවාරි මස මාසික පණිවුඩයේදී, 'අගර්හීත බෝධිසත්වයන් වහන්සේ වාගේ' යනුවෙන් නම් කර තිබුනා. එහිදී එදිනෙද ජීවිතය තුල ගෞරව වන්දනා කිරිම පුහුණු විය හැකි ආකාරයන් නොයෙකුත් හැඩයන් විදියට සදහන් කර තිබුනා. (聴) යන කන්ජි අකුර තුල සවන්දීම හා සමාව දීම යන අරුත් ගැබ්වී තිබේ. කෙන්ජි මියසාවා මහතාගේ වැස්සට පරාජය නොවී යන කවි පන්තියේද මෙයට ගැලපේ. නව වසරේ සුභාෂිංසනය ලෙසින්, ආත්මාර්ථකාමිත්වය තුරන්කර, යථාර්තවාදීව නිවැරදිව සැම දෙයම භාර ගැනීම අධිෂ්ඨාන කරමි.
බොහොම ස්තුතියි

කෙයිචි අකගාවා මහතා ගැන තොරතුරු බිඳක්

ජපානයේ, අකිතා ප්‍රාන්තයේ උපත ලද අකගාවා මහතා, 1986 වර්ෂයේදී ගකුරින් පාසලට ඇතුලත් විය. එම පාඨමාලාව අවසානයේ රිෂ්ෂෝ කෝසෙයි සංවිධාන මුලස්ථානයේ අන්‍ය ආගමික සහයෝගිතාව හා සාමය උදකරලීමේ ක්‍රියාකාරකම් වල වසර 26 ක් නියැලී සිටියා. ඉන්පසු ලෝක සාමය සදහා වු ආගමික සමුළුවේ (WCRP) ජිනීවා කාර්යලයේ වසර 2 ක් සේවය කලා. 2007 වසරේ සිට බාහිර කටයුතු සබධතා කාර්යාලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂක ලෙස කටයුතු කර, 2015 වසරේදී මෙගුරෝ ශාඛාවේ කියෝකයිචෝ ලෙස පත්විය. 2020 දෙසැම්බර් මස 01 දින සිට අන්තර්ජාතික මුලස්ථාන ප්‍රධානී ලෙසින් රාජකාරි ඇරඹීය.



We welcome comments on our newsletter Living the Lotus: living.the.lotus.rk-international@kosei-kai.or.jp

# Rissho Kosei-kai: A Global Buddhist Movement




**Rissho Kosei-kai Buddhist Church of Hawaii**
2280 Auhuhu Street, Pearl City, HI 96782, USA
TEL: 1-808-455-3212 FAX: 1-808-455-4633
Email: sangha@rkhawaii.org URL: http://www.rkhawaii.org

**Rissho Kosei-kai Maui Dharma Center**
1809 Nani Street, Wailuku, HI 96793, USA
TEL: 1-808-242-6175 FAX: 1-808-244-4625

**Rissho Kosei-kai Kona Dharma Center**
73-4592 Mamalahoa Highway, Kailua-Kona, HI 96740, USA
TEL: 1-808-325-0015 FAX: 1-808-333-5537

**Rissho Kosei-kai Buddhist Center of Los Angeles**
2707 East First Street, Los Angeles, CA 90033, USA
POBox 33636, CA 90033, USA
TEL: 1-323-269-4741 FAX: 1-323-269-4567
Email: rk-la@sbcglobal.net URL: http://www.rkina.org/losangeles.html

Please contact Rissho Kosei-kai Buddhist Center of Los Angeles
**Rissho Kosei-kai Buddhist Center of Arizona**
**Rissho Kosei-kai Buddhist Center of Colorado**
**Rissho Kosei-kai Buddhist Center of San Diego**
**Rissho Kosei-kai Buddhist Center of Las Vegas**
**Rissho Kosei-kai Buddhist Center of Dallas**

**Rissho Kosei-kai of San Francisco**
1031 Valencia Way, Pacifica, CA 94044, USA
POBox 778, Pacifica, CA 94044, USA
TEL: 1-650-359-6951 Email: info@rksf.org URL: http://www.rksf.org

Please contact Rissho Kosei-kai of San Francisco
**Rissho Kosei-kai of Sacramento**
**Rissho Kosei-kai of San Jose**

**Rissho Kosei-kai of New York**
320 East 39th Street, New York, NY 10016, USA
TEL: 1-212-867-5677 Email: rkny39@gmail.com URL: http://rk-ny.org

**Rissho Kosei-kai of Chicago**
1 West Euclid Ave., Mt. Prospect, IL 60056, USA
TEL: 1-773-842-5654
Email: murakami4838@aol.com URL: http://rkchi.org

**Rissho Kosei-kai of Fort Myers**
URL: http://www.rkftmyersbuddhism.org

**Rissho Kosei-kai Dharma Center of Oklahoma**
2745 N.W. 40th St., Oklahoma City, OK 73112, USA
POBox 57138, Oklahoma City, OK 73157, USA
TEL: 1-405-943-5030 FAX: 1-405-943-5303
Email: rkokdc@gmail.com URL: http://www.rkok-dharmacenter.org

**Rissho Kosei-kai Dharma Center of Denver**
1255 Galapago St. #809 Denver, CO 80204, USA
TEL: 1-303-446-0792

**Rissho Kosei-kai Dharma Center of Dayton**
617 Kling Drive, Dayton, OH 45419, USA
URL: http://www.rkina-dayton.com

**The Buddhist Center Rissho Kosei-kai International of North America (RKINA)**
2707 East First St., Suite #1, Los Angeles, CA 90033, USA
TEL: 1-323-262-4430 FAX: 1-323-269-4567
Email: dharmasa@rksabuddhistcenter.org
URL: http://rksabuddhistcenter.org

**Rissho Kosei-kai Buddhist Center of San Antonio**
(Address) 6083 Babcock Road, San Antonio, TX 78240, USA
(Mail) POBox 692148, San Antonio, TX 78249, USA
TEL: 1-210-558-4430 FAX: 1-210-696-7745
Email: dharmasanantonio@gmail.com
URL: http://www.rkina.org/sanantonio.html

**Rissho Kosei-kai of Seattle's Buddhist Learning Center**
28621 Pacific Highway South, Federal Way, WA 98003, USA
TEL: 1-253-945-0024 Email: rkseattlewashington@gmail.com
URL: http://buddhistlearningcenter.org

**Rissho Kosei-kai of Vancouver**
Please contact RKINA

**Risho Kossei-kai do Brasil**
Rua Dr. José Estefno 40, Vila Mariana, São Paulo-SP, CEP 04116-060, Brasil
TEL: 55-11-5549-4446, 55-11-5573-8377
Email: risho@rkk.org.br URL: http://www.rkk.org.br

**Risho Kossei-kai de Mogi das Cruzes**
Av. Ipiranga 1575-Ap 1, Mogi das Cruzes-SP, CEP 08730-000, Brasil

**在家佛教韓国立正佼成会**
〒 04420 大韓民国 SEOUL 特別市龍山區漢南大路 8 路 6-3
6-3, 8 gil Hannamdaero Yongsan gu, Seoul, 04420, Republic of Korea
TEL: 82-2-796-5571 FAX: 82-2-796-1696

**在家佛教韓国立正佼成会釜山支部**
〒 48460 大韓民国釜山廣域市南區水營路 174, 3F
3F, 174 Suyoung ro, Nam gu, Busan, 48460, Republic of Korea
TEL: 82-51-643-5571 FAX: 82-51-643-5572

**社團法人在家佛教立正佼成會**
台湾台北市中正區衡陽路 10 號富群資訊大厦 4 樓
4F, No. 10, Hengyang Road, Jhongjheng District, Taipei City 100, Taiwan
TEL: 886-2-2381-1632, 886-2-2381-1633 FAX: 886-2-2331-3433

**台南市在家佛教立正佼成會**
台湾台南市崇明 23 街 45 號
No. 45, Chongming 23rd Street, East District, Tainan City 701, Taiwan
TEL: 886-6-289-1478 FAX: 886-6-289-1488
Email: koseikaitainan@gmail.com

**Rissho Kosei-kai South Asia Division**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8141 FAX: 66-2-716-8218

**Rissho Kosei-kai of Kathmandu**
Ward No. 3, Jhamsikhel, Sanepa-1, Lalitpur, Kathmandu, Nepal

**Rissho Kosei-kai of Kolkata**
E-243 B. P. Township, P. O. Panchasayar, Kolkata 700094, India

**Rissho Kosei-kai of Kolkata North**
AE/D/12 Arjunpur East, Teghoria, Kolkata 700059,
West Bengal, India

**Rissho Kosei-kai of Bodhgaya Dharma Center**
Ambedkar Nagar, West Police Line Road, Rumpur, Gaya-823001,
Bihar, India

**Rissho Kosei-kai of Patna Dharma Center**
Please contact Rissho Kosei-kai of Kolkata

**Rissho Kosei-kai of Central Delhi**
77 Basement D.D.A. Site No. 1, New Rajinder Nagar,
New Delhi 110060, India

**Rissho Kosei-kai of Singapore**
Please contact Rissho Kosei-kai International

**Rissho Kosei-kai of Phnom Penh**
W.C. 73, Toul Sampaov Village, Sangkat Toul Sangke, Khan Reouseykeo,
Phnom Penh, Cambodia

**RKISA Rissho Kosei-kai International of South Asia**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8141 FAX: 66-2-716-8218

**Rissho Kosei-kai of Bangkok**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8216 FAX: 66-2-716-8218 Email: info.thairissho@gmail.com

**Rissho Kosei Dhamma Foundation**
No. 628-A, Station Road, Hunupitiya, Wattala, Sri Lanka
TEL: 94-11-2982406 FAX: 94-11-2982405

**Rissho Kosei-kai of Polonnaruwa**
Please contact Rissho Kosei Dhamma Foundation

**Rissho Kosei-kai Bangladesh**
85/A Chanmari Road, Lalkhan Bazar, Chittagong, Bangladesh
TEL/FAX: 880-31-626575

**Rissho Kosei-kai Mayani**
Mayani Barua Para, Mirsarai, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Damdama**
Damdama Barua Para, Mirsarai, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Satbaria**
Village: Satbaria Bepari Para, Chandanaih, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Chendhirpuni**
Village: Chendhirpuni, P.O.: Adhunogar, P.S.: Lohagara, Chittagong,
Bangladesh

**Rissho Kosei-kai Raozan**
Dakkhin Para, Ramzan Ali Hat, Raozan, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Laksham**
Village: Dhupchor, Laksham, Comilla, Bangladesh

**Rissho Kosei-kai Dhaka**
408/8 DOSH, Road No 7 (West), Baridhara, Dhaka, Bangladesh

**Rissho Kosei-kai Cox's Bazar**
Ume Burmize Market, Tekpara, Sadar, Cox's Bazar, Bangladesh

Please contact Rissho Kosei-kai Bangladesh
**Rissho Kosei-kai Patiya**
**Rissho Kosei-kai Ramu**
**Rissho Kosei-kai Aburkhiln**

**Buddiyskiy khram "Lotos"**
4 Gruzinski Alley, Yuzhno-Sakhalinsk 693005, Russia
TEL: 7-4242-77-05-14

**Rissho Kosei-kai of Hong Kong**
Flat D, 5/F, Kiu Hing Mansion, 14 King's Road, North Point, Hong Kong, China

**Rissho Kosei-kai Friends in Shanghai**

**Rissho Kosei-kai of Ulaanbaatar**
(Address) 15F Express Tower, Peace avenue, khoroo-1, Chingeltei district,
Ulaanbaatar 15160, Mongolia
(Mail) POBox 1364, Ulaanbaatar-15160, Mongolia
TEL: 976-70006960 Email: rkkmongolia@yahoo.co.jp

**Rissho Kosei-kai of Erdenet**
Please contact Rissho Kosei-kai International

**Rissho Kosei-kai di Roma**
Via Torino, 29, 00184 Roma, Italia
TEL/FAX: 39-06-48913949 Email: roma@rk-euro.org

Please contact Rissho Kosei-kai di Rome
**Rissho Kosei-kai of Paris**
**Rissho Kosei-kai of Venezia**

**Rissho Kosei-kai of the UK**
29 Ashbourne Road, London W5 3ED, UK
TEL: 44-20-8933-3247 Email: info@rkuk.org URL: https://www.rkuk.org
Facebook: https://www.facebook.com/rkuk.official
Twitter: https://twitter.com/rkuk_official
Instagram: https://www.instagram.com/rkuk_official

**Rissho Kosei-kai International Buddhist Congregation (IBC )**
166-8537 東京都杉並区和田 2-7-1 普門メディアセンター 3F
Fumon Media Center 3F, 2-7-1 Wada, Suginami-ku, Tokyo 166-8537, Japan
TEL: 03-5341-1230 FAX: 03-5341-1224 URL: http://www.ibc-rk.org

**Published by Rissho Kosei-kai International**